## රන් ණය සේවාවේ ප්‍රධාන කරුණු

i. ඉතා පහසුවෙන් ගණුදෙනු කළහැකි ආයතනික වටපිටාව.

ii. පූර්ව දැනුම්දීමකින් තොරව ඔබගේ රන් භාණ්ඩ බේරා නිදහස් කරගැනීමට ඇති හැකියාව.

iii. සහනදායී පොළී අනුපාතයන් සහිත වෙළඳපළෙහි ලබා දෙන ඉහලම අත්තිකාරම් මුදල අප විසින් ලබාදීම

iv. මාස 1, 2, 3, 6, 9 සහ 12 යන කාල සීමාවන් යටතේ ආපසු ගෙවීමේ හැකියාව.

v. අත්දැකීම් බහුල, සුහදශීලි කාර්‍යය මණ්ඩලය.

vi. රන් භාණ්ඩ කිහිපයකට අත්තිකාරම් මුදල ලබාගෙන ඇති අවස්ථාවලදී අවශ්‍යය භාණ්ඩ/ භාණ්ඩය පමණක් නිදහස් කර ගැනීමේ හැකියාව.

vii. පූර්ව දැනුම්දීමකින් තොරව ඔබ විසින් හෝ ඔබ විසින් නම් කරන ලද පුද්ගලයෙකු විසින් ගෙවීම් කිරීමේ හැකියාව.

viii. දිවයින පුරා පිහිටි ස්ථාන 450 කට වඩා වැඩි ශාඛා ප්‍රමාණයකින් ඔබගේ පහසුව සඳහා වාරික ගෙවීම් කිරීමට හැකිවීම.

ix. විශ්වාසනීය, විශිෂ්ටත්වයකින් යුතු ඉහළම ආරක්ෂාවක් ඔබගේ වටිනා රන් භාණ්ඩ සඳහා හිමිවීම.

x. පළමු දින 10 සඳහා පොළියක් අය නොකෙරේ.

## සේවාව ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය

- රත්‍රන් හෝ රත්‍රන් ආභරණ (16k - 24k) හිමි වයස 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ට රන් ණය පහසුකම් ලබා ගත හැකිය.

## ප්‍රධාන කොන්දේසි

- මාස 1, 2, 3, 6, 9 සහ 12 යන කාල වලදී ආපසු ගෙවන ලෙස ණය මුදල ලබා ගත යුතුය. ණය මුදල සඳහා පොළී අනුපාතිකය ස්ථාවර පොළී අනුපාතිකයක් වන අතර එය ඔබට ලබා දුන් රන් ණය ටිකට්පතෙහි සඳහන් වේ, පොළී ගණනය කිරීම දිනපතා සිදුවේ.

## සේවාව සඳහා අදාල නීතිමය විධිවිධාන

- මෙම සේවාව පාලනය වන්නේ 1949 අංක 06 දරණ උකස් පනත යටතේ වන අතර ප්‍රධාන වශයෙන් 85, 86, 87 සහ 88 වගන්ති අදාළ වේ.

## පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය

- සිංගර් ෆිනෑන්ස් වෙබ් අඩවියේ පල කර ඇති පැමිණිලි මෙහෙයවීමේ ප්‍රතිපත්තිය කරුණාකර බලන්න.